

# ජීවනය දෙන තැනැත්තාව දැන ගැනීම

## ටිනු යොහානන්

*ටිනු යොහානන් හිටපු ඉන්දියානු පන්දු යවන්නෙක් වන අතර 2014-2018 කාලය තුල කේරල ප්‍රාන්ත කණ්ඩායමේ පන්දු යවන පුහුණුකරු ලෙස නැවත ක්‍රිකට් පිටියට එක්විය. ඔහු වර්ථමානයේ කේරල ප්‍රාන්ත පුහුණු අභ්‍යාස ව්‍යුහය භාරව කටයුතු කරයි.*



ටිනු යොහානන්
ඉන්දියාව

මම ක්‍රීඩාවට යොමු වුණු පවුලක කෙනෙක්. මගේ තාත්තා, ටී. සී. යොහනන්, දුර පැනීමේදී මීටර 8ක් දුර පැන්න පළමු ආසියානු ක්‍රීඩකයා වුණා. ඒ නිසා මලල ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න තමයි මගෙත් බලාපොරොත්තුව වුණේ. මම මහන්සි වෙලා පුහුණු වීම් කලා. පාසල් කාලේදීම දුර පැනීම් තරග වලින් ප්‍රාන්තය නියෝජනය කරන්න මට අවස්ථාව ලැබුණා. පාසල් ජීවිතයේ අවසන් අවුරුදු කීපයේ මම ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වුණා. එතකොට මට වේගයෙන් පන්දු යවන්න පුළුවන් කියලා තේරුණා. ඉතින් මම ඒ පැත්තෙන් උත්සහයක් අරන් මේ ක්‍රීඩාවේ ඉහළට යන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කලා.

දේව කරුණාවෙන් මට ලෝකයේ හිටපු ඉහළම පුහුණුකරුවෙක් හා ඕස්ට්‍රේලියාවේ හිටලු පන්දු යවන්නෙක් වන, ඩෙනිස් ලිලීගෙන් පුහුණුව ලබන්න අවස්ථාව ලැබුණා. අවුරුදු පහක් පුහුණු වෙලා ක්‍රිකට් ගැන දැන ගන්න පුළුවන් හැම දෙයක්ම ඉගෙන ගත්තා. 2001දී මට ඉන්දියානු ජාතික කණ්ඩායම නියෝජනය කරන්න අවස්ථාව උදා වුණා. මේක හරියට හීනයක් සැබෑ වුණා වගේ , මට විතරක් නෙමෙයි මගේ ප්‍රාන්තයටත් මොකද ඒ වෙනකන් කේරළ ප්‍රාන්තයෙන් කිසි කෙනෙක් ජාතික මට්ටමට ගිහින් හිටියේ නැහැ. මේ ක්‍රීඩාව තුල මගේ රට වගේම මගේ ප්‍රාන්තය නියෝජනය කරන්න ලැබුණු එක ලොකු ජයග්‍රහණයක්.

2001 දෙසැම්බර් මාසයේ මගේ මංගල තරගයේදී මම යවපු හතරවන පන්දුවේදී මට කඩුල්ලක් දවා ගන්න හැකි වුණා. පළමු පිටියේදීම මම සාර්ථක වුණා. අවුරුදු 21 වෙනකොට මම ගොඩක් හොඳ තැනකට ඇවිත් තියෙනවා කියලා දැනුනා. කාටවත් මාව වට්ටන්න බැහැ, කාටවත් මේ ක්‍රීඩාව මගෙන් වෙන් කරන්න බැහැ වගේ දැණුනා. ඒ මොහොත වෙනුවෙන් මම ජීවත් වුණා. මගේ ප්‍රියතම තරුව වුණු සචින් ටෙන්ඩුල්කාර් එක්ක මම එකට ක්‍රීඩා කළා.

2003 වසරේ ආබාධයට ලක් වන තුරු අවුරුදු දෙකක කාලයක් මම ජාතික කණ්ඩායම සමග ක්‍රීඩා කලා. මම මුලින් හිතුවේ මට නැවතත් ඉක්මණින් ඉදිරියට එන්න පුළුවන් වෙයි කියලයි, මම හිතුවේ මාව කාටවත් නවත්තන්න බැහැ කියලයි. නමුත් මට ඒ අවස්ථාව නැවත එන්නේ නැහැ කියලා දැනුනම තමයි මට මේක ලේසි නැහැ කියලා තේරුණේ. මම අවුරුදු 4ක් ඉතා මහන්සි වෙලා පුහුණු වීම් කලා ඒත් මට නැවත ජාතික කණ්ඩායමට යන්න බැරි වුණා.

ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරපු නිවසක හැදී වැඩුණු මට යාච්ඤාව, බයිබලය කියවීම පුරුදු දෙයක්ව තිබුණා. මම පවුලේ අයත් එක්ක යාච්ඤා කරල දිනපතා බයිබලය කියවපු හොඳ කිතුණු අනුගාමිකයක්. නමුත් ක්‍රිකට් කණ්ඩායමේ තැන නැතිවෙන කාලයේ තමයි මට දෙවියන් වහන්සේට සැබැවින්ම ළං වෙන්න ඕනේ කියන එක දැණුනේ. මම විශ්වාස කළේ මම යම් ඉලක්කයක් ලගා කරගත්තාම මට එයින් සමාදානය හා විවේකය ලැබෙයි කියලයි. නමුත් ඒක වුණේ නැහැ.

එතකොට මම දෙවියන් වහන්සේව හොයන්න පටන් ගත්තා. උන්වහන්සේ මගේ ජීවිතයට විවිධ පුද්ගලයින් ගොනාවා - මම ඊට කලින් දැනගෙන වත් හිටියේ නැති අය - ඒ අය මගේ ජීවිතයට දෙවියන් වහන්සේගේ සැලැස්මක් හා පරමාර්ථයක් තියෙනවා කියලා කිව්වා. මම කරදර වෙන්න ඕනේ නැහැ උන්වහන්සේ මාව බලාගනී කියලා කිව්වා.

මම දෙවියන් වහන්සේගේ වචනය ගැන හොයන්නත් තේරුම් ගන්නත් පටන් ගත්තා. 2007 මැයි මාසයේ මගේ ජීවිතය වෙනස් වුණ අවස්ථාව උදා වුණා. දෙවියන් වහන්සේ පමණක් නොවේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කියන්නේ කවුද කියලා මට වැටහුණා. මම යාච්ඤා කරලා බයිබලය කියෙව්වත් යේසුස් වහන්සේ සැබැවින්ම කවුද කියලා දැනගෙන හිටියේ නැහැ. ක්‍රිස්තුස් වහන්සේ මා වෙනුවෙන් මැරුණු බවත්, මට උන්වහන්සේ තුල ජීවනය දීමට උන්වහන්සේ දිවි පිදුව බවත් මම තේරුම් ගත්තා උන්වහන්සේ දෙවියන් වහන්සේව මා තුල ජීවත් වනවා.

මේ එළිදරව්ව මගේ ජීවිතය ක්ෂණිකව වෙනස් කලා. මගේ පාලකතුමා එක්ක මුණ ගැහුණු ඒ මොහොතේ මගේ ජීවිතය වෙනස් වෙනවා මට දැනුණා. ස්වර්ගීය දෙවියන් වහන්සේ මා සමග බවත් මට ආදරේ බවත් මම දැනගත්තා. මේ අලුත් සත්‍යය මට අලුත් ජීවයක් දුන්නා. ජීවය දෙන තැනැත්තා උන්වහන්සේ පමණයි කියලා එදා දෙවියන් වහන්සේ මට පැහැදිලිව කථා කළා. අපේ ජීවිත දෙන්න තරම් වටින වෙන කිසිවක් නැහැ.යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල සැබෑ සමාදානය හා ජීවනය ලබා දෙන එකම තැනැත්තා

උන්වහන්සේ නිසා මම කරන හැමදෙයක්ම කරන්නේ උන්වහන්සේ වෙනුවෙන් විතරයි. මේ එළිදරව්ව මගේ සෑම භයක්, පීඩනයක් හා කරදර වීමක් ඉවත් කළා. ක්‍රිකට් දිවිය පුරා මම උසුලාගෙන හිටපු හැම බරක් හා වේදනාවක් එවේලේම මගෙන් ඉවත් වුණා. එදා ඉඳලා ක්‍රිකට් පිටියට ගිය හැම අවස්ථාවකම තවත් මම නිසා නොව දෙවියන් වහන්සේ මා තුලින් ක්‍රියා කරන බව දැන ගත්තා. එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගේ මහිමය කරණකොට ගෙන මළවුන්ගෙන් නැගිටවනු ලැබුවා සේම, අපිත් ජීවනයේ අලුත් කමින් හැසිරෙන පිණිස, මරණය තුලට බෞතිස්මය කරණකොට ගෙන උන්වහන්සේ සමග තැම්පත් කරනු ලැබුවෙමුව. රෝම 6:4 මම තවත් පරණ ටීනු නොවෙයි. මම ජීවත් වන්නේ යේසුස් වහන්සේ තුල, ක්‍රිස්තුස් වහන්සේ මා තුල ඉන්නවා. උන්වහන්සේ මට මගපෙන්නනවා.

මගේ ප්‍රියතම බයිබල් පදය ගීතාවලිය 32:8 - “ඔබට උගන්වන්නෙමි. ඔබ විසින් යා යුතු මාර්ගයෙහි ඔබට ගුරුකම් දෙන්නෙමි. මාගේ ඇස ඔබ කෙරේ යොමු කර ඔබට දැනමුතු කම් දෙන්නෙමි.” මේ වචනය මගේ ජීවිතයේ මට ලොකු ශක්තියක් දෙන කුළුණක් හා යථාර්තයක් වෙලා තියෙනවා.

මේ ලෝකයේ ඔබ ලබා ගන්නා කිසිවක් - නම්, ප්‍රසිද්ධිය, සල්ලි - මේ කිසිවක් ක්‍රිස්තුස් වහන්සේ සමග ජීවිතයට සමාන කරන්නවත් බැහැ.ලෝකය ඔබට දෙන හැම දේකටම වඩා ඔබේ ආත්මය වටිනවා. ඔබේ ආත්මය ගළවා ගන්නට පුළුවන් එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් පමණයි. මම අද අත්විදින සැබෑ ප්‍රීතිය පැමිණෙන්නේ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල පමණය.



ටීනු ගේ ප්‍රියතම බයිබල් පදය:

**“ඔබට උගන්වන්නෙමි. ඔබ විසින් යා යුතු මාර්ගයෙහි ඔබට ගුරුකම් දෙන්නෙමි. මාගේ ඇස ඔබ කෙරේ යොමු කර ඔබට දැනමුතු කම් දෙන්නෙමි”**

**- ගීතාවලිය 32:8**